සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

151
RICHMOND COLLEGE LIBRARY
* GALLE *

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 6 ශ්‍රේණිය
## පෙරදිග සංගීතය

**නම/විභාග අංකය :-** ........................................................................................ **කාලය : පැය 02යි.**

### i කොටස

♦ **වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයකි.

   1. ගිටාරය  2. වයලීනය  3. සර්පිනාව  4. සිතාරය

2. 'සුවඳ පද්ම ඔලු ආදී....' ගීතය අයත් වන නූර්ති නාට්‍ය වනුයේ,

   1. විදුර  2. වෙස්සන්තර  3. රාමායනය  4. දුටුගැමුණු

3. සරිග-, රිගම-, ...... යන ස්වර රටාවට ගැලපෙන ඊළඟ ස්වර රටාව තෝරන්න.

   1. පධනි-  2. ගමප-  3. මපධ-  4. ධනිස්-

4. ස්වර සප්තකයේ පස්වන ස්වරය,

   1. මධ්‍යමයයි  2. රිෂභයයි  3. පංචමයයි  4. නිෂාධයයි

5. සසරිරි/ග-ම-/සරිගම/පධප- මින් කියවෙන ස්වර ස්ථාපන ගීතය වන්නේ,

   1. මුණිසිරිපාදේ  2. බැතින සිරිපා  3. කඳුපෙළ අතරේ  4. ඇත ඇදී යලි

♦ **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා වගන්ති හරි නම් හරි ලකුණ (√) ද වැරදි නම් වැරදි ලකුණ (X) ද වරහන් තුළ යොදන්න.**

6. නිවැරදි ස්වර ගායනය සඳහා සවන් දීම ඉතා වැදගත් වේ. (   )
7. පෙරදිග සංගීතය පැවති ප්‍රධානතම රට ශ්‍රී ලංකාවයි. (   )
8. පාංශුලික අනන්‍යතාවය, අභිමානය පාසල් ගීයෙන් කියැවේ. (   )
9. එළුවන් කෑම සත්ත්ව චරිත දෙකක් ඇතුළත් ජන ක්‍රීඩාවකි. (   )
10. ජාතික ගීය ගායනා කිරීමේ දී තමාට පහසු ඉරියව්වකින් සිටිය යුතු ය. (   )

♦ **A කොටසට ගැළපෙන පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| | A | B |
|---|---|---|
| 11. | ශුද්ධ ස්වර ස්ථාපන ගීතයකි | ඇහැළ මලින් ගස් පිරිලා |
| 12. | කෙළි ගීතයකි | අද වෙස්සන්තර රාජ පුතා |
| 13. | ළමා ගීතයකි | ජලේ හොඳයි බැසලා පීනන්නට |
| 14. | නූර්ති ගීතයකි | බැතින සිරිපා කරුණා කරනා |
| 15. | නාට්‍ය ගීතයකි | සෙන්පතියන් ගැන නැව්පතියන් ගැන |

♦ මෙහි දැක්වෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.




හරහට

16. නූර්ති සංගීතයේ ප්‍රධාන ස්වර වාද්‍ය භාණ්ඩය මෙය වේ.

19. ගැමියන්ගේ ජන ක්‍රීඩා අතර දක්නට ලැබෙන ජන නැටුමකි.

20. ප්‍රධාන තත් හතකින් යුත් මෙම භාණ්ඩය වාදනය සඳහා මිස්රාබ් නම් උපකරණයක් භාවිත කරයි.

පහළට

17. හින්දුස්ථානි රාගධාරී සංගීතයේ ආභාෂය ලද ගීත විශේෂයකි.

18. පෙරදිග අපරදිග සම්ප්‍රදායන් දෙකෙහිම භාවිත වන සංගීත භාණ්ඩයකි. (ලකුණු 2 බැගින් 2 x 20 = 40)

## II කොටස

♦ පළමු ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.

01. i. සංගීතයේ භාවිත වන ශුද්ධ ස්වර හත පිළිවෙලින් ලියන්න. (ලකුණු 4)
ii. එම ස්වර සඳහා පෙරදිග ස්වර නාම හා අපරදිග ස්වර සංකේත ලියන්න. (ලකුණු 8)
iii. පහත සඳහන් ස්වර ස්ථාපන ගීත අතරින් එක් ගීතයක් තෝරා ගෙන එම ගීතය ගීත ස්වර ප්‍රස්ථාර කරන්න.
a) එකට සතුටු සාගරේ.....
b) කඳු පෙළ අතරේ....
c) බැතින සිරිපා.... (ලකුණු 8)

2. i. ඔබ දන්නා නූර්ති නාට්‍ය දෙකක නම් ලියන්න. (ලකුණු 4)
ii. නූර්ති නාට්‍ය පිළිබඳව ඔබ ඉගෙනගත් කරුණු තුනක් ලියන්න. (ලකුණු 6)
iii. නූර්ති ගීතයක පද මාලාව සම්පූර්ණයෙන් ලියන්න. (ලකුණු 10)

3. i. ළමා ගීත රචනා කර ඇති රචකයන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 4)
ii. ළමා ගීතයක දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 8)
iii. ඔබ දන්නා ළමා ගීතයක පද මාලාව සම්පූර්ණයෙන් ලියන්න. (ලකුණු 8)

4. i. පහත සඳහන් සංගීත භාණ්ඩ රවුම තුළ අදාළ ස්ථානයන්හි ලියන්න.
බට නලාව, සිතාරය, වයලීනය, ගිටාරය, තබ්ලාව, මවුත් ඕගන්, පියානෝව, විද්‍යුත් ස්වර පුවරුව, යක් බෙරය




(එක් භාණ්ඩයක් නම් කිරීමට ලකුණු 1 1/2 බැගින් ලකුණු - 12)

ii. ඉහත සඳහන් සංගීත භාණ්ඩ අතුරින් ඔබ කැමති භාණ්ඩ දෙකක් නම් කර එම භාණ්ඩවලට අදාළව කරුණු දෙක බැගින් ලියන්න.
(ලකුණු 08)

5. පහත සඳහන් ස්වර අභ්‍යාසයේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| ස රි ග ම | - - - - | ග ම ප ධ | - - - - | ප ධ නි සं |
| - - - - | නි ධ ප ම | - - - - | - - - - | ම ග රි ස |

(එක් හිස්තැනකට ලකුණු 2 බැගින් - ලකුණු 2 x 5 = 10)

... ස්වර ... සයක් තාලානුකූලව ආරෝහණ/අවරෝහණ ලෙස ගොඩනගන්න (ලකුණු 10)

6. තාsත තානා ... /නාsතම් දනාs/ නාs s s s s

i. ඉහත තානම අයත් කෙළි ගී වර්ගය නම් කරන්න.
(ලකුණු 4)

ii. එම කෙළි ගී වර්ගයට අයත් කවියක් ලියන්න.
(ලකුණු 4)

iii. ඔබ විසින් ලියන ලද කවිය ගායනයේ දී වාදනය කළ හැකි වාද්‍ය භාණ්ඩ දෙකක් ලියන්න. (ලකුණු 4)

iv. දේශීය ජන ක්‍රීඩා තුළින් ගැමි සමාජයේ දරුවන්ට ලැබුණු යහපත් ගුණාංග දෙකක් ලියන්න. (ලකුණු 8)